# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/39 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/13 හා 2023.01.30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 වැනි දින නොපැවැත්වෙන බව ද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බව  ද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ.ස්ටැන්ලි ද මෙල්,
තේරීම්භාර නිලධාරි,
මන්නාරම පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39057 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මන්නාරම නගර සභාව

නානාට්ටාන් ප්‍රාදේශීය සභාව

මුසලි ප්‍රාදේශීය සභාව

මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව

EOG 03 - 0097

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.